# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 27 දරන අත්තනගල්ල සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ජූලි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2008 ජූලි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2008 අංක 27 දරන අත්තනගල්ල සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 ජූලි මස 15 වන දින]

එල්. ඩී.— ඕ. අයි. එන්. සී. 23/2004

### අත්තනගල්ල සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“අත්තනගල්ල සංවර්ධන පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව එකී පදනමේ පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2008 අංක 27 දරන අත්තනගල්ල සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අත්තනගල්ල සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) “අත්තනගල්ල සංවර්ධන පදනමේ” දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “අත්තනගල්ල සංවර්ධන පදනම” යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුයයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) දිළිඳු ශ්‍රී ලාංකිකයන්ට නිවාස සැපයීම;

(ආ) අනාථ ළමයින්ට ආහාර, ඇඳුම් පැළඳුම්, ඖෂධ සැපයීම සහ දිළිඳු අය සඳහා වෛද්‍ය සායන පැවැත්වීම

(ඇ) ශ්‍රී ලංකාවේ වරප්‍රසාද අඩු ළමයින්ගේ සාමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතික වර්ධනය උදෙසා කටයුතු කිරීම, ශිෂ්‍යත්ව දීම සහ කැපකරු මාපිය ක්‍රමය පිහිටුවීම ;

(ඈ) කාන්තාවන්ගේ ආර්ථික තත්වය ශක්තිමත් කිරීම සඳහා ස්වයං රැකියා වැඩසටහන් ආරම්භ කිරීම, දැනුම ලබාදීම සහ ස්වයං රැකියා සඳහා ඔවුන් හට ණය ආධාර ලබාදීම;

(ඉ) මහලු නිවාස හා අනාථ නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම, මන්ද බුද්ධිකයන්ගේ හා අංග විකල වූවන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ශ්‍රී ලාංකික යෞවනයන් සහ වෙනත් ජාතීන්ට අයත් යෞවනයන් අතර, උචිත ක්‍රම මගින් මිත්‍ර සම්බන්ධතා නංවාලීම, පදනමේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් සඳහා ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ඉඩ කඩ සැලසීම හා ලංකාවෙන් විදේශ රටවලට නියෝජිත මණ්ඩල යැවීම සහ දෙස් විදෙස් වැඩ මුළු සංවිධානය කිරීම ;

(උ) යෞවනයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තිය පුහුණු වැඩ සටහන් පැවැත්වීම සහ ව්‍යාපාරික ව්‍යවසායන් ආරම්භ කිරීම ස්වයං රැකියා ව්‍යාපෘතිවල යෙදීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම හෝ මවුන්ගේ නිෂ්පාදන විකුණා ගැනීමට සැලැස්වීම, මිලදී ගැනීම, වෙළෙඳ සල් පවත්වාගෙන යාම සහ සත්ව පාලනය සංවර්ධනය කිරීම සඳහා ගොවිපොලවල් පවත්වාගෙන යාම ;

(ඌ) ආගමික සිද්ධස්ථානවලට ආධාර උපකාර කිරීම, දහම් පාසල් අධ්‍යාපනය නංවාලීම පිණිස ආධාර උපකාර කිරීම, භික්ෂූන් වහන්සේලාට ඔවුන්ගේ අධ්‍යාපනය කරගෙන යාමට ආධාර කිරීම, වෛද්‍යාධාර සැපයීම ;

(එ) පරිසරය ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සහ සියලු ප්‍රජාව දැනුවත් කිරීම ;

(ඒ) පාසල් හැර යන්නන්ට පරිගණක අධ්‍යාපනය ලබාදීම සහ භාෂා අධ්‍යාපනය ලබාදීම සඳහා කටයුතු කිරීම ;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා සහ සංදර්ශන පැවැත්වීම ; සහ

(ඕ) සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති වෙනත් ආයතන සහ සංවිධාන සමග සම්බන්ධිකරණයෙන් කටයුතු කිරීම.

4. මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතිවල විධිවිධානවලට යටත්ව සංස්ථාවට පහත දැක්වෙන බලතල ඇත්තේ ය. :— සංස්ථාවේ බලතල.

(අ) දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් අරමුදල් ලබාගැනීම සහ මුදලින් හෝ ද්‍රව්‍යයයන්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම ;

(ආ) සංස්ථාවේ අරමුදල් වැඩි ආදායමක් ලබාදීමට ඉඩ ඇති යම් ආයෝජනවල ආයෝජනය කිරීම හා එවැනි ආයෝජන ආපසු ගැනීම හෝ ප්‍රති ආයෝජන කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් සේවයෙහි යොදා ගැනීම සහ නියුක්ත කර ගැනීම හා ඔවුන්ට පාරිශ්‍රමික හා පාරිතෝෂික ගෙවීම සහ ඒ නිලධරයන් හා සේවකයන් විෂයයෙහි විනය පාලනය ;

(ඈ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, වසා දැමීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම ;

(ඉ) සංස්ථාවේ අරමුණු මුදුන් පත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු දේ ඉටු කිරීම.

5. (1) සංස්ථාවේ රීති මගින් විධිවිධාන යොදා ඇති පරිදි හා ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලැබූ වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලය විසින් මෙම පනතේ විධිවිධාන සහ සංස්ථාව විසින් 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව එහි කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින් ම වූ දිනයේ දී සංගමයේ කළමනාකරණ කමිටුවේ ධුර දරනු ලැබුවා වූ තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම සඳහා ද කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීමද, කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සඳහා සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා ද, සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකදී ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනි ම රැස්වීමක දී ඒ හා සමාන ආකාරයෙන් ම වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් තත්කාලයේ සංස්ථාව විසින් සාදනු ලබන රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**7.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ පැවති පදනමේ ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, පදනමට අයවිය යුතු සියලු ණය හා ඒ දිනට පදනමට ගෙවනු ලැබිය යුතුව ඇති දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතුවන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය හා හැකියාව තිබිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින් මතු භාර ගනු ලබන ත්‍යාග, පැවරුම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල් හෝ දායක මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු කීපයක සංස්ථාවේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) මේ පනත යටතේ ප්‍රවර්ති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේදී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයා භාරයෙහි තිබිය යුතු අතර, එය සභාපතිවරයා සහ ලේකම්වරයා ඉදිරිපිට දී හැර, කවර හෝ ලේඛනයකට හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඒ සභාපතිවරයා සහ ලේකම් විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

විගණනය හා ගිණුම්.

11. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරුවන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. සංස්ථාව විසුරුවා හරිනු ලැබීමේ දී සංස්ථාවේ ණය හා බැරකම් පියවීමෙන් පසුව යම් දේපළක් ශේෂ වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදාදීම නොකළ යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ වෙනත් සංගම්වලට දීම හෝ පැවරීම කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.